සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

10527

**වර්ෂ අවසාන ඇගයීම - 2025**
**ஆண்டிறுதி மதிப்பீடு - 2025**
**Year End Evaluation - 2025**

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper | I | කාලය / காலம் / Time | පැය 01 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ..................................................  විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..................................

සැලකිය යුතුයි

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80 ක් හිමි වේ.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු ලකුණු කිරීමේ පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(01) ප්‍රශස්ති කාව්‍යයක් ලෙස සැලකෙන පැරණි සාහිත්‍ය මූලාශ්‍රයක් වන්නේ මින් කුමක් ද?
(1) සැලළිහිණි සන්දේශය (2) සීතාවක හටන (3) සද්ධර්මාලංකාරය (4) පැරකුම්බා සිරිත

(02) කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමා විසින් කරවන ලද ගල්පොත සෙල්ලිපිය පිහිටා තිබෙන්නේ,
(1) අනුරාධපුරයේ ය. (2) පොළොන්නරුවේ ය. (3) මිහින්තලේ ය. (4) රජගල ය.

(03) මළ සිරුරු දිරායන තුරු වළලා දමා පසුව ඇටසැකිළි ගොඩගෙන නැවතත් ඒවා තැන්පත් කළ බවට සාධක ලැබෙන්නේ කුමන යුගයේ දී ද?
(1) ඓතිහාසික යුගය (2) මුල් ඓතිහාසික යුගය
(3) ප්‍රාග් ඓතිහාසික යුගය (4) පූර්ව ඓතිහාසික යුගය

(04) මුල් ඓතිහාසික යුගයේ ජනතාව ගංගා නිම්නය තුළ පදිංචි වීම පිළිබඳ පැහැදිලි සාක්ෂි හමු වූ ගංගාව මින් කුමක ද?
(1) කලා ඔය (2) කුඹුක්කන් ඔය (3) කිරිඳි ඔය (4) වළවේ ගඟ

- A, B, C හා D ප්‍රකාශ ඇසුරෙන් පහත 5 සහ 6 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - වැව් පද්ධතියට අයත් ගම් සියල්ල නියෝජනය කිරීම. B - ගමට අයත් වැව නඩත්තු කිරීම
C - ගම් කිහිපයක ජීවත් වූ වැසියන්ගේ සුභ සිද්ධිය සඳහා තීරණ ගැනීම. D - ගම්වල පැවති ආරවුල් විසඳීම.

(05) පරුමකවරුන්ගේ කාර්යයන් සම්බන්ධ නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A හා D ය. (2) A හා C ය. (3) B හා C ය. (4) C හා D ය.

(06) ගමිකයන් ඉටුකළ කාර්යයන් සම්බන්ධ නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A හා C ය. (2) B හා C ය. (3) A හා D ය. (4) B හා D ය.

(07) ගොවියන් විසූ ගම් මූලාශ්‍රයවල හඳුන්වා ඇත්තේ කුමන නමින් ද?
(1) පට්ටනගාම (2) කුම්භකාරගාම (3) කසීකාරගාම (4) ගෝපාලගාම

(08) I තීරුවේ සඳහන් රජවරු විසින් ඉටුකළ කාර්යයන් II තීරුවේ දැක්වේ. I තීරුව සමග II තීරුව නිවැ අනුපිළිවෙළින් ගැළපූ විට පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. වසභ | A- පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීම. |
| 2. පළමුවන විජයබාහු | B- පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයකට චේර රාජ්‍යයට යෑම. |
| 3. භාතිකාභය | C- පළාත් බෙදා පරිපාලනය විධිමත් කිරීම. |
| 4. පළමුවන ගජබාහු | D- රෝමයෙන් වීදුරු පබළු ගෙන ඒමට දූත පිරිසක් යැවීම. |

(1) C, A, D, B (2) B, A, C, D (3) A, C, D, B (4) D, A, C, B



CamScanner
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

(09) රාජ්‍යත්ව සංකල්ප අනුව පර්වත රාජ සංකල්පයෙන් පෙනී සිටි රජතුමා,
(1) පළමුවන කාශ්‍යප (2) කූටකණ්ණ අභය (3) දුටුගැමුණු (4) නිශ්ශංකමල්ල

(10) මාතොට වරායට සමීපව ඉදිකරනු ලැබූ පැරණි හින්දු කෝවිල මින් කුමක් ද?
(1) මුන්නේශ්වරම කෝවිල (2) තිරුකේතීශ්වරම කෝවිල
(3) කෝණේශ්වරම කෝවිල (4) නල්ලූර් කෝවිල

(11) ඉතා ඈත අතීතයේ දී අපේ මුතුන් මිත්තන් දහනය සඳහා ඔක්සිජන් වායුව අවශ්‍ය බව දැන සිටි බවට හොඳම නිදසුන වන්නේ,
(1) පැරණි මැටි බඳුන් ය. (2) පුලුස්සා ආහාරයට ගත් කැලෑ දෙල් ඇට
(3) මැටි ඔරු සුසාන (4) මහා ශිලා සුසාන

(12) සංකීර්ණ භෞතික විද්‍යාත්මක මූලධර්ම පිළිබඳ දැනුම පැරණි ශ්‍රී ලාංකික ඉංජිනේරුවන් සතුව පැවති බවට තොරතුරු හෙළි වන්නේ,
(1) ආලාහන පිරිවෙනින් හමු වූ ශල්‍ය වෛද්‍ය උපකරණ ය.
(2) සමනළ වැව ප්‍රදේශයෙන් හමු වූ යකඩ තැනූ උදුන් ය.
(3) අභයගිරි කැනීම්වලින් හමු වූ වර්ණාලිප්ත උළු ය.
(4) දැදිගම කොටවෙහෙරින් හමු වූ ඇත් පහන ය.

(13) ඓතිහාසික යුගයේ සමාජ සංවිධානය තුළ සමාජයේ පහළින් ම සිටි කණ්ඩායම වූයේ,
(1) කම්මල්කරුවන් ය. (2) ධීවරයන් ය. (3) එඬේරුන් ය. (4) දාසයන් ය.

(14) අපරාධකරුවන් අල්ලාගන්නා තුරු ඔහු ජීවත් වූ ගමේ වැසියන් විසින් රජයට ගෙවිය යුතු බදු වර්ගය හැඳින් වූයේ කුමක් ද?
(1) ගෘහ දණ්ඩ (2) කැති අඩ (3) දකපති (4) බොජකපති

(15) තෙවරක් මෙරට පාලනය කළ රැජිනිය ලෙස ඉතිහාසයේ සඳහන් වන්නේ,
(1) ලීලාවතී ය. (2) චූල සීවලී ය. (3) කල්‍යාණවතී ය. (4) සුගලා ය.

- පහත දැක්වෙන වගන්ති ඇසුරෙන් 16, 17 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - වන්නි ප්‍රදේශ කෝට්ටේ රාජ්‍යයට යටත් කර ගැනීම.
B - මාඝගෙන් රජරට මුදවා ගැනීම.
C - චන්ද්‍රභානු නම් ජාවක ආක්‍රමණිකයා පළවා හැරීම.
D - ජෝතිය සිටුවරයා ඇතිකළ කැරැල්ල මැඩ පැවැත්වීම.

(16) දෙවන පරාක්‍රමබාහු රජතුමා සම්බන්ධ නිවැරදි වගන්ති වන්නේ,
(1) A හා B ය. (2) B හා C ය. (3) A හා C ය. (4) A හා D ය.

(17) හයවන පරාක්‍රමබාහු රජතුමා සම්බන්ධ නිවැරදි වගන්ති වන්නේ,
(1) B හා C ය. (2) B හා D ය. (3) A හා D ය. (4) A හා C ය.

(18) සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන්නේ,
(1) දඹදෙනි යුගය යි. (2) කුරුණෑගල යුගය යි. (3) ගම්පොළ යුගය යි. (4) කෝට්ටේ යුගය යි.

(19) පහත සඳහන් ඓතිහාසික තොරතුරු අතුරින් ගම්පොළ යුගයට අයත්වන තොරතුර කුමක් ද?
(1) සිංහල සංගෙ නමින් කැරැල්ලක් ඇතිවීම.
(2) ඉබන් බතූතා නම් අරාබි සංචාරකයා මෙරටට පැමිණීම.
(3) පන්සිය පනස් ජාතක පොත සිංහලට පරිවර්තනය කිරීම.
(4) පාණ්ඩ්‍ය හමුදාවක් විසින් දළදාව ඉන්දියාවට රැගෙන යාම.

(20) යාපනය රාජධානිය සම්බන්ධ නොගැළපෙන වගන්තිය තෝරන්න.
(1) සංකිලි රජු කතෝලික ආගම ව්‍යාප්ත කිරීමට පෘතුගීසීන්ට උදව් කිරීම.
(2) යාපනයේ පාලකයන්ට නිත්‍ය හමුදාවක් නොසිටීම.
(3) යාපන රාජධානියට ස්වභාවික ආරක්ෂාවක් නොතිබීම.
(4) රාජ්‍ය උරුමකරුවන් අතර බල අරගලයක් පැවතීම.



CamScanner
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

l) උඩරට අල්ලා ගැනීමට පෘතුගීසීන් විසින් මෙහෙය වූ අවසන් ආක්‍රමණය වූයේ,

(1) බලන සටන (2) ගන්නෝරුව සටන (3) දන්තුරේ සටන (4) රන්දෙණිවල සටන

- පහත A හා B ඇසුරෙන් 22 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A - පහතරට ඇතැම් ප්‍රදේශවල වී වගාව දියුණු කිරීම.

B - කුරුඳු, වගාවක් ලෙස ආරම්භ කිරීම.

) ලන්දේසීන්ගේ ආර්ථික ප්‍රතිපත්ති සම්බන්ධයෙන්,

(1) A හා B සත්‍ය වේ.
(2) A හා B අසත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
(4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

) පුනරුදය මුලින්ම ආරම්භ වූයේ ඉතාලියේ කුමන නගරය ආශ්‍රිතව ද?

(1) ජිනෝවා (2) වැනීසිය (3) රෝමය (4) ප්ලෝරන්ස්

) ලියනාඩෝ ඩාවින්චි විසින් නිර්මාණය කරන ලද විශිෂ්ට කලා කෘතියක් වන්නේ මින් කුමක් ද?

(1) අවසාන විනිශ්චය
(2) මොනාලිසා
(3) ආදම්ගේ චිත්‍රය
(4) දේව දරුවන් දෙදෙනාගේ චිත්‍රය

කාර්මික විප්ලව සමයේ දී හම්ප්‍රිඩේව් ආරක්ෂක ලාම්පුව නිපදවීම නිසා දියුණුවට පත් වූයේ,

(1) යකඩ හා වානේ කර්මාන්තය යි.
(2) ගල් අඟුරු කර්මාන්තය යි.
(3) ප්‍රවාහන ක්ෂේත්‍රය යි.
(4) කෘෂිකාර්මික ක්ෂේත්‍රය යි.

- බෙංගාල බොක්කට මුහුණලා පිහිටීම.
- ඊසාන දිග මෝසම් සුළඟින් ආරක්ෂිතව නැව් නවතා තැබිය හැකි වීම.

ඉහත කරුණු සම්බන්ධයෙන් ඉංග්‍රීසීන්ගේ අවධානය යොමු වූ වරාය කුමක් ද?

(1) කොළඹ වරාය (2) ගාලු වරාය (3) ත්‍රිකුණාමල වරාය (4) කල්පිටිය වරාය

) මැක්ඩොවල්ගේ නායකත්වයෙන් උඩරට ආක්‍රමණය මෙහෙය වූ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා,

(1) රොබට් බ්‍රවුන්රිග් ය.
(2) එඩ්වඩ් බාන්ස් ය.
(3) තෝමස් මෙට්ලන්ඩ් ය.
(4) පෙඩ්රික් නෝර්ත් ය.

පහත A සිට D දක්වා තොරතුරුවලින් 1818 නිදහස් සටනට තුඩුදුන් හේතු පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

A - නව අධිකරණ ක්‍රමය
B - රජයේ නව බදු ප්‍රතිපත්තිය
C - උඩරට ප්‍රභූ පන්තියට පහර වැදීම
D - නිදහස අහිමිවීම හා රජෙකු නොමැතිවීම පිළිබඳ පසුතැවිල්ල

(1) B හා C (2) C හා D (3) B හා D (4) A හා B

ශ්‍රී ලංකාවේ ජාතික පුනරුදය සම්බන්ධයෙන් දී ඇති තොරතුරු අනුව I තීරුව සමග II තීරුව නිවැරදිව ගැළ විට පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. පරම විඥානාර්ථ සමාගම පිහිටුවීම | A- පොන්නම්බලම් රාමනාදන් මහතා |
| 2. ලංකා ජාතික සංගමය පිහිටුවීම | B- පොන්නම්බලම් අරුණාචලම් මහතා |
| | C- හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා |

(1) A හා B (2) A හා C (3) C හා B (4) C හා A

බ්‍රිතාන්‍යයන් විසින් ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ කිහිපයක ලක්ෂණ පහත දැක්වේ ඒවා ඇසුරෙන් 30 සහ 31 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - සර්වජන ඡන්ද බලය
B - අග්‍රාණ්ඩුකාර තනතුර ස්ථාපනය කිරීම
C - විධායක කාරක සභා ක්‍රමය
D - ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම
E - අධිකරණ සේවා කොමිසම පිහිටුවීම

ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යෝජනා පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A හා C (2) A හා D (3) B හා C (4) B හා E



CamScanner

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

සෝල්බරි ප්‍රතිසංස්කරණ යෝජනා පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) D හා E (2) B හා C (3) B හා E (4) A හා D

බ්‍රිතාන්‍ය පාලන සමයේ අපනයනය ඉලක්ක කරගෙන සිදුකළ වතු වගාවක් නොවන වගාව කුමක් ද?
(1) කෝපි (2) කොකෝවා (3) රබර් (4) පොල්

පහත A, B, C හා D යටතේ දක්වා ඇති එක් එක් යුගලයෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවය පරීක්ෂාකර බලා අංක 33 සිට 35 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. කියුබානු මිසයිල් අර්බුදය
2. ජාතීන්ගේ සංගමය

B - 1. පැසිස්ටවාදය
2. මුසෝලිනී

C - 1. එක්සත් ජාතීන්ගේ සංවිධානය
2. පරමාණු බලශක්ති කොමිසම

D - 1. පරිසර දූෂණය
2. යුධ ගැටුම්

පළමුවැන්න නිසා දෙවැන්න බලවත්වීම පෙන්වන යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

දෙවැන්නෙහි වර්ධනය සමග පළමුවැන්න වර්ධනය වන බව පෙන්වන යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධයක් නොදැක්වෙන යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

- A - බැස්ටීල් බන්ධනාගාරයට පහරදීම B - බොස්ටන් තේ සාදය
C - පිලඩෙල්පියා සම්මේලනය D - ටෙනිස් පිට්යේ දිවුරුම

ප්‍රංශ විප්ලවය සම්බන්ධ නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A හා D ය. (2) B හා D ය. (3) C හා D ය. (4) A හා B ය.

ඇමරිකන් නිදහස් සටන සම්බන්ධ නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A හා B ය. (2) B හා C ය. (3) B හා D ය. (4) A හා D ය.

රුසියන් විප්ලවයේ ප්‍රතිඵලයක් වන්නේ,
(1) මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ලොව පුරා ඇතිවූ උනන්දුව
(2) රූසෝ විසින් ජනතා ස්වාධිපත්‍යය පිළිබඳ සංකල්පය ඉදිරිපත් කිරීම
(3) ලෝකයේ ප්‍රථම ලිඛිත සන්ධීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බිහිවීම
(4) සමාජවාදී දර්ශනය ලොව පුරා ව්‍යාප්ත වීම

නොබැඳි ජාතීන්ගේ සමුළුව පිහිටුවා ගැනීම සඳහා පුරෝගාමී වූ නායකයා කවුරුන් ද?
(1) ජවහර්ලාල් නේරුතුමා (2) මාර්ෂල් ටිටෝ
(3) අබ්දුල් ගමාල් නසාර් (4) ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට්

එක්සත් ජාතීන්ගේ දිනය ලෙස නම් කර ඇත්තේ,
(1) සැප්තැම්බර් 24 (2) ඔක්තෝබර් 24 (3) නොවැම්බර් 24 (4) දෙසැම්බර් 24



CamScanner
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved



වර්ෂ අවසාන ඇගයීම - 2025
ஆண்டிறுதி மதிப்பீடு - 2025
Year End Evaluation - 2025

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 03 යි |

නම / பெயர் / Name ..........................................  විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..................................

සැලකිය යුතුයි

- I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

10500

## I කොටස

(01) (අ) i. පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.
කළු ගඟ, මැණික් ගඟ, කන්තලේ වැව, මාදුරුඔය ජලාශය, පදවිය වැව, මාතලේ, බදුල්ල, රංචාමඩම, පාහියන්ගල ගන්නොරුව, මුලතිව්, මන්නාරම (ලකුණු 12)

ii. පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න. ජිනෝවා, බොම්බාය, බුරුමය (මියන්මාර්), ග්‍රෝව්, බතාවිය, කළු මුහුද (ලකුණු 06)

(ආ) i. පහත A, B, C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුර අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - මින්නේරි දෙවියන් ලෙස පූජනීයත්වයට පත් වූ රජතුමා කවුරුන් ද?
B - පුරාණ වෙළෙඳපලවල් සංවිධානාත්මකව පාලනය වූ බව දැක්වෙන සෙල්ලිපියේ නම කුමක් ද?
C - මෙරට මුහුදු බඩ ප්‍රදේශවල පාලන කටයුතු සඳහා පත්කර එවන ලද පළමු ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා නම් කරන්න.
D - රුසියාව ආක්‍රමණය කර පරාජයට පත් වූ ප්‍රංශ අධිරාජයාගේ නම කුමක් ද? (ලකුණු 04)

ii.

A



1. 'A' වලින් දැක්වෙන සිතුවමේ නිරූපිත රජතුමා කවුරුන් ද?
2. මෙතුමා විසින් පාලනය කළ ඓතිහාසික රාජධානිය නම් කරන්න.
3. මෙතුමා රාජ්‍යත්වයට පත්වීමට පෙර හැඳින්වූ නම කුමක් ද?
4. මෙම සිතුවම අඳින ලදැයි සැලකෙන පුද්ගලයා නම් කරන්න.

(ලකුණු 04)

iii.

1. 'B' රූපය හඳුනාගෙන නම් කරන්න.
2. එය පිහිටි රට කුමක් ද?
3. මෙම ආයතනය අයත්වන්නේ කුමන සංවිධානයට ද?
4. මෙම ආයතනය මගින් සිදුකරන එක් කාර්යයක් ලියන්න.

(ලකුණු 04)

B





CamScanner
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

## II කොටස

(02) i. ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ ප්‍රාග් ඓතිහාසික මානවයන් ජීවත් වූ බවට සාධක හමුවන ස්ථාන තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන රටාවේ කැපී පෙනුණු ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 04)

iii. ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයේ ඇති වූ වෙනස්කම් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

iv. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්ති රටාවේ දක්නට ලැබෙන ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(03) i. අතීත ශ්‍රී ලංකාවේ සත්ත්ව පාලනය යටතේ ඇති කරන ලදැයි සැලකෙන සත්ත්ව වර්ග තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii. පුරාණ කාලයේ මෙරට සමාජයේ වෘත්තීයමය වශයෙන් පැවති කර්මාන්ත හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. ඉතා ඈත අතීතයේ පවා මෙරට හේන් ගොවිතැන පැවති බව නිදසුන් දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

iv. අතීත ශ්‍රී ලංකා ආර්ථිකයෙහි දේශීය හා විදේශීය වෙළෙඳාම දියුණු මට්ටමක තිබූ බව කරුණු තුනක් සහිතව විස්තර කරන්න. (ලකුණු 06)

(04) i. පහත සඳහන් වැව් ඉදිකරන ලද රජවරු අනුපිළිවෙළින් නම් කරන්න.

A - තුරුළු වැව
B - කලා වැව
C - පදවිය වැව (ලකුණු 03)

ii. අතීත පාලකයන් මහ වැව් ඉදිකිරීමෙන් ඉටුකර ගැනීමට බලාපොරොත්තු වූ අරමුණු දෙකක් ලියන්න. (ලකුණු 04)

iii. අතීත ශ්‍රී ලංකාවේ යකඩ නිස්සාරණ තාක්ෂණය පිළිබඳව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

iv. අතීතයේ දී මෙරට සනීපාරක්ෂක කටයුතු සහ වෛද්‍ය ක්‍රම දියුණුව පැවති ආකාරය නිදසුන් තුනක් සහිතව විස්තර කරන්න. (ලකුණු 06)

(05) i. පහත සඳහන් පුද්ගලයින් පෘතුගීසීන් වෙතින් බෞතීස්ම ලැබීමට පෙර හැඳින් වූ නම් අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A - අවුස්ත්‍රියාවේ දොන් ජුවාන්
B - දොන් පිලිප්
C - දෝන කතරිනා (ලකුණු 03)

ii. මහනුවර රාජධානියේ වැරදිකරුවන්ට ලබාදුන් දඬුවම හතරක් ලියන්න. (ලකුණු 04)

iii. මහනුවර රාජධානියේ සමාජ සංවිධානය සකස් වී පැවති ආකාරය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

iv. මහනුවර රාජධානි සමයෙහි ආර්ථික ක්‍රමය සකස් වී පැවති ආකාරය නිදසුන් තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CamScanner

(06) i. ප්‍රංගවරු විසින් ඉන්දියාවේ පිහිටුවනු ලැබූ වෙළෙඳ මධ්‍යස්ථාන තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii. මියුරන් කොමිසමේ නිර්දේශ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. 1815 දී උඩරට රාජධානිය ඉංග්‍රීසීන්ට පහසුවෙන් ම යටත්කර ගැනීමට බල පෑ සාධක දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

iv. 1818 නිදහස් සටනට තුඩුදුන් හේතු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(07) i. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් ඡන්ද විමසීම් ක්‍රම තුනක් ලියන්න. (ලකුණු 03)

ii. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල දක්නට ලැබුණු වෙනස්කම් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

iv. නිදහසින් පසු මුල් දශක තුන ඇතුළත ශ්‍රී ලංකාවේ සමාජ සුබ සාධනය දියුණු කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

## III කොටස

(08) i. බ්‍රිතාන්‍යයේ රෙදිපිළි කර්මාන්තයේ දියුණුව සඳහා ඉවහල් වූ යන්ත්‍ර සූත්‍ර තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii. කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයේ ආරම්භ වීමට බල පෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 04)

iii. කාර්මික විප්ලවයේ බලපෑම නිසා ලෝකයේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඇති වූ දියුණුව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

iv. ශ්‍රී ලංකාව කෙරෙහි කාර්මික විප්ලවයේ බලපෑම සිදුවූ ආකාරය නිදසුන් තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(09) i. දෙවන ලෝක සංග්‍රාමයේ දී අක්ෂ බලවතුන් ලෙස හැඳින් වූ රටවල් තුන නම් කරන්න. (ලකුණු 03)

ii. වර්සේල්ස් ගිවිසුම මගින් ජර්මනියට පමුණුවනු ලැබූ දැඩි දඬුවම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. පළමුවන හා දෙවන ලෝක සංග්‍රාමයන්ට ඇමෙරිකා එක්සත් ජනපදය සම්බන්ධ වීමට හේතු වූ සිදුවීම් දෙක කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

iv. දෙවන ලෝක මහා සංග්‍රාමයේ ප්‍රතිඵල තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)



CamScanner

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම - 2025
# ஆண்டிறுதி மதிப்பீடு - 2025
# Year End Evaluation - 2025

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | පිළිතුරු |


## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1. 4 | 11. 3 | 21. 2 | 31. 3 |
| 2. 2 | 12. 4 | 22 1 | 32. 4 |
| 3. 3 | 13. 4 | 23. 4 | 33. 2 |
| 4. 3 | 14. 1 | 24. 2 | 34. 4 |
| 5. 2 | 15. 1 | 25. 2 | 35. 1 |
| 6. 4 | 16. 2 | 26. 3 | 36. 1 |
| 7. 3 | 17. 3 | 27. 4 | 37. 2 |
| 8. 1 | 18. 4 | 28. 2 | 38. 4 |
| 9. 1 | 19. 2 | 29. 3 | 39. 1 |
| 10. 2 | 20. 1 | 30. 1 | 40 2 |


මුළු ලකුණු 2×40=80

## II පත්‍රය

(01) (අ) i.




(අ) ii.





www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

(ආ) i. A - මහසෙන් රජතුමා
B - හෝපිටිගමුව සෙල්ලිපිය/ සොරබොරවැව ටැම් ලිපිය/ බදුලුටැම් ලිපිය - මින් එකක් ලිවීම
C - පෙඩ්රික් නෝර්ත් D - නැපෝලියන් බොනපාට් (ලකුණු 04)

ii. 1. දෙවන රාජසිංහ රජතුමා 2. සෙංකඩගල/ මහනුවර
3. මහා අස්ථාන කුමාරයා 4. රොබට් නොක්ස් (ලකුණු 04)

iii. 1. අන්තර්ජාතික අධිකරණය 2. නෙදර්ලන්තය 3. එක්සත් ජාතීන්ගේ සංවිධානයට
4. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විවිධ ආයතනවලට අවශය උපදෙස් ලබාදීම/ රටවල් අතර පැන නගින ආරවුල්වලට නීතිමය විසඳුම් ලබාදීම - මින් එකක් ලිවීම (ලකුණු 04)

(02) i. පාහියන්ගල, කුරුවිට බටදොඹලෙන, බෙල්ලන්බැඳි පැලැස්ස, කිතුල්ගල බෙලිලෙන, මාතියම්ගම
මින් තුනක් ලිවීම (ලකුණු 03)

ii. සතුන් දඩයම් කිරීම, ආහාර සඳහා වන ද්‍රව්‍ය රැස් කිරීම, ආහාරයේ ස්වභාවය පරිසරය අනුව තීරණය වීම, සංචාරක ජීවිතයක් ගත කිරීම, කුඩා කණ්ඩායම් වශයෙන් ජීවත්වීම, වර්ෂා කාලවල දී ගල්ගුහාවල ද වියළි කාලයේ එළිමහන් ප්‍රදේශවල ද ජීවත්වීම, මළවුන් සම්බන්ධ අභිචාර විධි අනුගමනය කිරීම, දෛනික කාර්යයන් සඳහා විවිධ මෙවලම් භාවිතය - ලක්ෂණ දෙකක් ලිවීම (ලකුණු 2×2=04)

iii. යකඩ ලෝහභාවිතය, පිළිස්සූ මැටි වළං භාවිතය, ක්‍රමවත් සුසාන චාරිත්‍ර විධි අනුගමනය, ස්ථිරවාසීතාව, කෘෂිකර්මාන්තය ඇරඹීම - වෙනස්කම් දෙකක් විස්තර කිරීම (ලකුණු 2+3=05)

iv. කුඩා වැව් කේන්ද්‍ර කරගෙන ජනාවාස ඇරඹීම, ගංගාවල පිටාර නිම්නයන්ට පිටතින් ජනාවාස ව්‍යාප්ත වීම, පවුල් සංඛ්‍යාව 5-6 සිට 30 අතර වීම, ගමික ගමේ ප්‍රධානියා වීම, ගම් කුඩා කැලෑ රොදකින් වෙන් වීම, ජන සංඛ්‍යාව වැඩි ජනාවාස නගර ලෙස හැඳින්වීම - මින් කරුණු තුනක් විස්තර කිරීම (ලකුණු 3+3=06)

(03) i. ගවයා, එළුවා, කුකුළා - තුනක් ලිවීම (ලකුණු 03)

ii. ලෝහ කර්මාන්තය (යකඩ, තඹ, ටින්, රන් ලෙස වෙනම ලියා තිබුණත් ලකුණු දෙන්න), ඇත්දත් කර්මාන්තය, මැටි භාණ්ඩ තැනීමේ කර්මාන්තය (කුඹල් කර්මාන්තය), රෙදි විවීමේ කර්මාන්තය, උක් හකුරු කර්මාන්තය
කර්මාන්ත හතරක් ලිවීම (ලකුණු 1+4=04)

iii. • පුරා විද්‍යාත්මක හා සාහිත්‍ය මූලාශ්‍රය මගින් තහවුරු වීම (බුත් සරණ, උම්මග්ග ජාතක කතාව, සෙල්ලිපි)
• නව දැලි හේන පිළිබඳ විස්තර කිරීම • හේන්වල බෝග වගා කිරීම • හේන් වගාවට බදු අය කළ බව
ආදී පැරණි හේන් වගාව පිළිබඳ උදාහරණ දෙකක් සහිතව විස්තර කිරීම (ලකුණු 2+3=05)

iv. දේශීය
• නගරවල වෙළෙන්දන් සිටීම (දේශීය, විදේශීය) • වෙළෙඳාම ප්‍රධාන ජීවනෝපායක් වීම
• වෙළෙඳ සංවිධාන පැවතීම • වෙළෙඳ පොළවල් පැවතීම (කාලසුමන, හෝපිටිගමුව)
• බදු අය කිරීම • වෙළෙඳාම සම්බන්ධ නීති (සොරබොරවැව ටැම් ලිපිය)
• කිරුම් මිනුම් ක්‍රම භාවිතය

විදේශීය
• විදේශ වෙළෙඳ සංවිධාන • වෙළෙඳ සබඳතා පැවැත් වූ රටවල් • වෙළෙඳ වරායන්
• හුවමාරු ද්‍රව්‍ය • තීරුබදු අයකිරීම
(යටත් පිරිසෙයින් දේශීය හා විදේශීය වෙළෙඳාම පිළිබඳ එක් කරුණක් හෝ ඇතුළත් වන පරිදි කරුණු 03ක් පැහැදිලි කළ යුතුය.) (ලකුණු 3+3=06)

(04) i. A - මහසෙන් රජතුමා B - ධාතුසේන රජතුමා C - දෙවන මුගලන් රජතුමා (ලකුණු 03)

ii. • කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය ලබා ගැනීම • ගංවතුර පාලනය
• නාගරික ජල අවශ්‍යතා සපුරා ගැනීම • නියංකාල වල දී ජල අවශ්‍යතාව සපුරා ගැනීම
අරමුණු දෙකක් ලිවීම (ලකුණු 2+2=04)

iii. • බලංගොඩ සමනල වැව ප්‍රදේශයේ යකඩ නිස්සාරණය කළ ආකාරය
• සීගිරිය අලකොලවැව දෙහගහ ඇළකන්ද ප්‍රදේශයේ යකඩ නිස්සාරණය කළ ආකාරය විස්තර කිරීම
(ලකුණු 2+3=05)

iv. • රජවරු රෝහල් ඉදිකිරීම • බුද්ධදාස රජතුමා වෛද්‍යවරයෙකු ලෙස සතුන්ට වෙදකම් කිරීම
• පැරණි රෝහල් නටබුන් සැත්කම් උපකරණ, බෙහෙත් ඔරු, ඇඹරුම් ගල්, ඔසු උයන් ආදිය
• වෛද්‍යවරුන් සඳහා ගම්බිම් වෙන් කිරීම • පැරණි වෙදපොත්



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

සනීපාරක්ෂක කටයුතු

අපද්‍රව්‍ය කළමනාකරණය, වැසිකිළි අප ද්‍රව්‍ය ඉතා ගැඹුරු වළකට පිට කිරීම, අපවිත්‍ර ජලය ගලායාමට සැකසූ කාණු පද්ධති, නාන පොකුණුවල අප ජලය විශේෂ නළ මාර්ග හරහා පිට කිරීම, ගොඩනැගිලි ප්‍රමාණයට ගැලපෙන ලෙස වැසිකිළි සාදා තිබීම

මෙවැනි නිදසුන් තුනක් සහිතව විස්තර කිරීම. වෛද්‍ය ක්‍රම හා සනිපාරක්ෂාව යන දෙකින්ම කරුණු විස්තර විය යුතුය (ලකුණු 3+3=06)

(05) i. A - කොනප්පු බණ්ඩාර B - යමසිංහ බණ්ඩාර C - කුසුමාසන දේවිය (ලකුණු 03)

ii. අතුල් පහර දීම, දඬුගැසීම, දඬුකඳේ ගැසීම, ඇතුන් ලවා පාගවා මැරීම, කස පහර දීම, ඉපලෙන් තැලීම, දඟගෙයි ලෑම, පිටුවහල් කිරීම, රොඩී රැහැට දැමීම, හිසකෙස් කැපීම, දියේ ගිල්වා මැරීම, උල තැබීම

මින් හතරක් ලිවීම (ලකුණු 04)

iii.
- සියලු ඉඩම්වල උරුමකරුවා රජු වීම
- ඉඩම්වල අයිතිය හා බුක්තිය පදනම් කරගෙන කොටස් කිපයකට බෙදීම (ගබඩාගම්, නින්දගම්, විහාරගම්, දේවාලගම්, පරවේණි ගම්)
- ඉඩම් භුක්තිය වෙනුවෙන් සේවාවක් හෝ නියමිත භාණ්ඩ ප්‍රමාණයක් රජුට සැපයීම
- ග්‍රාමීය සමාජයක් පැවතීම
- සමාජ සම්බන්ධතා කුල ක්‍රමය මත පදනම් වීම
- කුලයට වෙන් වූ ආර්ථික කටයුතු
- කුලය මත පදනම් ආවාහ විවාහ
- අත්තම් ක්‍රමය
- පවුල හා බැඳුනු ගැමි දිවිය හා ගුණගරුක සමාජය - කරුණු දෙකක් ඇසුරින් විස්තර කිරීම (ලකුණු 2+3=05)

iv.
- ස්වයංපෝෂිත ආර්ථිකය
- හෙල්වල කුඹුරුවල වී වගාව. සීමිත වී ගොවිතැන
- හේන් ගොවිතැන වැඩි ඉඩම් ප්‍රමාණයක සිදුවීම
- ගෙවතු වගාව
- කර්මාන්ත පැවතීම (යකඩ, දැව, ලෝහ, ලාක්ෂා, පන්)
- සත්ව පාලනය
- දේශීය විදේශීය වෙළඳාම

නිදසුන් තුනක් ඇසුරින් විස්තර කිරීම (ලකුණු 3+3=06)

(06) i. පොන්ඩිචේරි, කරිකාල්, චන්ද්‍රනගර් (ලකුණු 03)

ii.
- මදුරාසි නිලධාරීන් ආපසු යවා දේශීය නිලධාරීන් යොදවාගෙන බදු එකතු කිරීම
- පොල්ගස් බද්ද ඇතුළු අලුත් බදු වර්ග ඉවත් කිරීම
- ආදායම් එකතු කිරීමට හා අධිකරණ කටයුතු සඳහා වෙන වෙනම නිලධාරීන් පත් කිරීම
- ලන්දේසි උසාවි ක්‍රමය නැවත පිහිටුවීම - නිර්දේශ දෙකක් ලිවීම (ලකුණු 2+2=04)

iii.
- ඉංග්‍රීසින්ගේ උපායශීලී කටයුතු (ජෝන් ඩොයිලිගේ ක්‍රියාකලාපය)
- ශ්‍රී වික්‍රම රාජසිංහ රජු හා උඩරට රදළ ප්‍රධානීන් අතර ඇති වූ මතභේද
- භික්ෂු ඝාතන නිසා භික්ෂූන් වහන්සේලා හා රජු අතර සබඳතාව ගිලිහී යාම
- රජුගේ ඇතැම් ක්‍රියාවන් නිසා රජු හා ජනතාව අතර සබඳතාව බිඳ වැටීම

මෙවැනි සාධක දෙකක් විස්තර කර තිබීම (ලකුණු 2+3=05)

iv.
- නිදහස අහිමිවීම හා රජෙකු නොමැතිවීම නිසා ඇති වූ පසුතැවිල්ල
- ආගම හා සංස්කෘතිය පිළිබඳ ගැටලු මතුවීම
- උඩරට ප්‍රභූ පන්තියට පහර වැදීම

හේතු තුනක් විස්තර කිරීම (ලකුණු 3+3=06)

(07) i. ජනාධිපතිවරණය, සමානුපාතික නියෝජන ක්‍රමය, ජනමත විචාරණය (ලකුණු 03)

ii.
- ලංකාව නමින් හැඳින් වූ මෙරට ශ්‍රී ලංකා යන නාමයෙන් හැඳින්වීම
- බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය සමග පැවති ව්‍යවස්ථානුකූල බැඳීම් අවසන් කිරීම
- ශ්‍රී ලංකාව ඒකීය රජයක් බව පිළිගැනීම
- ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් සුරක්ෂිත වීම

මින් මූලික ලක්ෂණ දෙකක් ලිවීම (ලකුණු 2+2=04)

iii.
- ආණ්ඩුකාරධූරය අහෝසිකොට අග්‍රාණ්ඩුකාර ධූරය
- ද්විමණ්ඩල පාර්ලිමේන්තුව
- අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලය
- රාජ්‍යසේවා කොමිසම හා අධිකරණසේවා කොමිසම

මින් ලක්ෂණ දෙකක් විස්තර කිරීම (ලකුණු 2+3=05)

iv.
- ග්‍රාමීය ප්‍රදේශවල අධ්‍යාපන කටයුතු දියුණු කිරීම
- රැකියා ලබා ගැනීමේ දී දක්ෂතාව මත හා තරඟ විභාග ක්‍රම
- කෘෂිකාර්මික හා ධීවර කටයුතු සඳහා රාජ්‍ය අනුග්‍රහය
- නිදහස, සමානාත්මතාව හා මූලික අයිතිවාසිකම් වැනි සංකල්ප ව්‍යවස්ථා ගත කිරීම
- ග්‍රාමීය ප්‍රදේශවල සෞඛ්‍ය පහසුකම් දියුණු කිරීම
- ග්‍රාමීය ප්‍රදේශවල යටිතල පහසුකම් දියුණු කිරීම
- ආහාර සහනාධාර දීම හා අඛණ්ඩව පවත්වා ගෙන යාම
- නිවාස ගැටලු විසඳීමට ක්‍රියාමාර්ග ගැනීම

කරුණු තුනක් විස්තර කිරීම (ලකුණු 3+3=06)



iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources CamScanner

**(08)** i. ද්‍රවන නඩාව, ජෙනි යන්ත්‍රය, ජල රාමුව, මියුල් යන්ත්‍රය - තුනක් ලිවීම (ලකුණු 03)

ii.
- කර්මාන්ත සඳහා ආයෝජනය කළ හැකි ධනවතුන් සිටීම
- බ්‍රිතාන්‍යයේ ජනගහන වර්ධනය නිසා දේශීය වෙළෙඳපොල පුළුල් වීම
- යටත් විජිත නිසා පුළුල් විදේශීය වෙළෙඳපොලක් ලැබීම
- යුරෝපා පුනරුදයෙන් ලැබුණු තාර්මික ඥානය යන්ත්‍ර සූත්‍ර නිපවීම සඳහා යොදා ගැනීම
- කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හා බලශක්තිය සුලභ වීම
- කර්මාන්ත හා ව්‍යාපාර සඳහා ප්‍රාග්ධනය සපයන බැංකු හා මූල්‍ය ආයතන බිහිවීම
- බ්‍රිතාන්‍යයේ පැවති දේශපාලන ස්ථාවරත්වය
- ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය නිසා අතිරික්ත ශ්‍රමය ලබාගත හැකි වීම
- ලන්ඩන් නගරය අමුද්‍රව්‍ය, ප්‍රාග්ධනය, නිෂ්පාදන ද්‍රව්‍ය බෙදා හරින මධ්‍යස්ථානයක් ලෙස පැවතීම
- සෙසු යුරෝපා රටවල් අභිබවා බ්‍රිතාන්‍ය වෙළෙඳ හා වානිජ කටයුතු අතර ඉදිරියෙන් සිටීම

මින් දෙකක් ලිවීම (ලකුණු 2+2=04)

iii.
- මැකඩම් ක්‍රමය
- වාෂ්ප බලයෙන් ක්‍රියා කරන දුම්රිය එන්ජිම
- දුම් බෝට්ටුව
- දුම් නැව
- මෝටර් රථය
- ගුවන් යානය

මින් ගොඩබිම ජලය හා ගුවනේ ප්‍රවාහන කටයුතු දියුණු වී ඇති ආකාරය කරුණු දෙකක් ඇසුරින් විස්තර කිරීම (ලකුණු 2+3=05)

iv.
- ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක් ලෙස පැවතීම නිසා කාර්මික විප්ලවය ශ්‍රී ලංකාව කෙරෙහි බලපෑම
- වතු වගාව ආශ්‍රිත විවිධ කර්මාන්ත ඇරඹීම හා ඒ සඳහා යන්ත්‍ර සූත්‍ර භාවිතය
- කම්කරු පන්තිය, කර්මාන්තශාලා හිමි ධනවතුන් උගත් ධනවත් මධ්‍යම පන්තිය ලෙස සමාජ පරිවර්තනය
- ධනවාදී ආර්ථික ක්‍රමය හා ආනයන අපනයන ආර්ථිකය
- මහා මාර්ග දුම්රිය මාර්ග ඉදිවීම
- තැපැල් සේවය, ටෙලිග්‍රාෆ් සේවය ආරම්භවීම - මෙවැනි කරුණු 03ක් පැහැදිලි කිරීම (ලකුණු 3+3=06)

**(09)** i. ජර්මනිය, ඉතාලිය, ජපානය (ලකුණු 03)

ii.
- ජයග්‍රාහී රටවලට විශාල වන්දි මුදලක් ගෙවීමට ජර්මනියට සිදුවීම
- හමුදා තබාගැනීම හා අවි ආයුධ නිෂ්පාදනය සඳහා ජර්මනියට සීමා පැනවීම
- ජර්මනිය ප්‍රංශයෙන් අල්ලාගෙන තිබූ ඇල්සාස් හා ලොරේන්ස් යන ප්‍රදේශ යළි ප්‍රංශයට පවරා දීම
- යුරෝපයෙන් පිටත ජර්මනිය සතු වූ යටත් විජිත ජයග්‍රාහී ජාතීන් අතර බෙදා ගැනීම

මින් දඬුවම් දෙකක් සඳහන් කිරීම (ලකුණු 04)

iii.
- ලුසිටානියා නැව ජර්මන් සබ්මැරීනයක් මගින් දියේ ගිල්වා දැමීම
- ජපානය පර්ල් වරායේ ඇමෙරිකානු නාවුක කඳවුරට බෝම්බ හෙළා විනාශ කිරීම

මෙම හේතු දෙක විස්තර කිරීම (ලකුණු 2+3=05)

iv.
- අක්ෂපිල පරාජයට පත් වීම
- මිනිස් ජීවිත දේපල හා ධන විනාශය
- පරමාණු බෝම්බ හෙළීම නිසා ඇති වූ විනාශය
- බ්‍රිතාන්‍ය හා ප්‍රංශය සතු යටත් විජිත රැසකට නිදහස ලැබීම
- ලෝක බලවතුන් ලෙස පෙනීසිටි ප්‍රංශයට හා බ්‍රිතාන්‍යයට එය අහිමිවීම හා ඇ.එ. ජනපදය හා සෝවියට් රුසියාව ලෝක බලවතුන් වීම
- විනාශයට පත් වූ යුරෝපා රටවල් නගා සිටුවීමට මාර්ෂල් සැලැස්ම හඳුන්වාදීම
- ධනවාදී හා සමාජවාදී ලෙස ලෝකයේ රටවල් බල කඳවුරු දෙකකට බෙදීම

මෙවැනි ප්‍රතිඵල තුනක් විස්තර කිරීම (ලකුණු 3+3=06)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CamScanner